**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2013**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කිරීම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකිය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට අදාල රු.80,150,942 ක ප්‍රචාරණ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,318,681 ක පොළී ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු රු.15,558,831 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ තොගය අගය කිරීමට යොදාගත් පදනම සහ ගණනය කළ ආකාරය හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** **පැහැදිලි නොකළ වෙනස්කම්**

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සහ පහත සඳහන් ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය (රු.) | උපයෝගී මූල්‍ය වාර්තාවල විස්තරය | අදාල ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනය | - | ණය ගැතියෝ | 2,960,342 | 2,960,342 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 26,091,753 | ණය ගැතියෝ | 26,127,775 | 36,022 |

**2.2.3** විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ලබා නොදීම නිසා එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | **විෂයය** | **වටිනාකම** (රු) | **ඉදිරිපත් නොකල සාක්ෂි** |
|---|---|---|---|
| (අ) | තුන් දින බැංගලෝර් ඉසව් කළමනාකරණය | 11,362,520 | කළ වැඩ වාර්තා |
| (ආ) | ගෙවිය යුතු වියදම් | 155,491,948 | ඉන්වොයිස් |
| (ඇ) | ඉසව් (Event CHOGM) | 359,392,539 | ටෙන්ඩර් ලියවිලි, භාණ්ඩ හා සේවා ගිවිසුම් |
| | | 181,835,691 | ඉන්වොයිස් |
| | | 3,935,028 | භාණ්ඩ භාර ගැනීමේ නිවේදනය |
| (ඈ) | වෙළඳ කටයුතු වියදම් | 53,566,583 | ටෙන්ඩර් ලියවිලි සහ මුදල් ලබා ගත් බවට තහවුරුව |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු රු. 1,102,961,333 ක ශේෂයේ රු.3,404,920 ක ශේෂය වර්ෂ 4කට වැඩි කාලයක්ද, රු.1,831,792 ක් වර්ෂ 2 කට වැඩි වර්ෂ 3 කට අඩු කාලයක් සහ රු.355,000 ක් වර්ෂ 1කට වැඩි වර්ෂ 2 කට අඩු කාලයක සිට හිඟව පැවති ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි.

(ආ) ගෙවිය යුතු රු. 26,136,236 ක ශේෂයේ රු.11,575,098 ක් වර්ෂ 6කට වැඩි කාලයක්ද,රු.203,890 ක් වර්ෂ 6ට අඩු වර්ෂ 5ට වැඩි කාලයක්ද,රු.48,000 ක් වර්ෂ 3ට වැඩි වර්ෂ 4ට අඩු කාලයක්ද, රු.1,258,647 ක් වර්ෂ 2ට වැඩි වර්ෂ 3ට අඩු කාලයක් සහ රු.6,913,097 ක් වර්ෂ 1ට වැඩි වර්ෂ 2 ට අඩු කාලයක් ගෙවිය යුතු ශේෂවලින් සමන්විත විය.

## 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ | |
| (i) 40 වගන්තියේ 09 උප වගන්තිය (අ) | වර්ෂයේ මාස හතක් අවසානයට පෙර අර්ධ වාර්ෂික ගිණුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 40 වගන්තියේ 09 උප වගන්තිය (ඉ) | පූර්ව වර්ෂය සඳහා ඉදිරිපත් කළ සැලැස්මට අදාල සාර්ථකත්වය හා කාර්ය සාධනය අන්තර්ගත ප්‍රකාශයක් වර්ෂය අවසානයේ සිට මාස 3 ක කාල සීමාවක් ඉකුත් වීමට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වගන්තියේ 5 උපවගන්තිය | සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.6,238,009 ක ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට මාරුකර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය. | |
| (i) 5 පරිච්ඡේදයේ 5.1.3 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතු වුවද, මේ නියමයන්ට අනුකූලවීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |

| | |
|---|---|
| (ii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සමග අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ යුතුය. කෙසේ වුවද, කාර්යාංශය මෙම අවශ්‍යතාවයට අනුකූලවීමට අසමත් වී තිබුණි. |
| (ඇ) 2006 ජාතික ප්‍රසම්පාදන වක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්තිය | ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද කාර්යාංශය එම අවශ්‍යතාවයට අනුව එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.6,238,009 ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.828,271,230 ක් වූයෙන් රු.822,033,221 ක අඩුවීමක් දැක්වුණි. රු.1,390,600,508 කින් වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් වැඩිවීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ ආදායම රු.මිලියන 2,021 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 1,444 සමග සැසඳීමේදී සියයට 39.9 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ වෙළඳ කටයුතු,අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 549 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 1,940 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 253.3 ක වියදම් වැඩිවීමක් පෙන්නුම් කෙරුණි

### 3.3 ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

ජාත්‍යන්තර ඉන්දියානු සිනමා සම්මාන උළෙල සම්බන්ධව රු.45,915,775 ක ගෙවීම් ලබාදෙන ලෙස කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබුණු නඩු 07 ක් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් නොවිසඳී තිබුණි.

### 3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ සහ පූර්ව වර්ෂ දෙකකට අදාලව ගණනය කරන ලද කාරක ප්‍රාග්ධන අනුපාත අනුව ප්‍රශස්ථ මට්ටමකට කාරක ප්‍රාග්ධනය පවත්වා නොගැනිමෙන් කාරක ප්‍රාග්ධනය කළමනාකරණය දූර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් රු.මිලියන 1,940 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම වියදම රු.මිලියන 549 ක් වූයෙන් වියදම් වැඩිවීම සියයට 253.3 ක් විය. එහෙත් වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් වැඩිවීමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය වී තිබුණේ සියයට 26.7 ක් පමණි. ඒ අනුව වෙළඳ කටයුතු සම්බන්ධව වියදම් වැඩියෙන් දැරීම සංචාරකයින්ගේ පැමිණීම ප්‍රවර්ධනයට ඍජුව බලපෑ බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(ආ) සංචාරක ප්‍රවර්ධන නියමු ප්‍රචාරක වැඩසටහන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේදී උක්ත වැඩසටහන සඳහා රු.මිලියන 68.94 ක වියදමක් දරා තිබුණි. එහෙත් උපරිම ප්‍රතිලාභ රටට ලබාදීම පිණිස සුදුසු සහ වාසිදායක මාධ්‍යකරුවන් තෝරාගැනීම සඳහා පදනම්කරගත් දර්ශක සහ සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කළයුතු වැඩසටහන් සංඛ්‍යාව පිළිබඳව පූර්ව සුදානමකින් තොරව රටවල් 29කින් මාධ්‍යකරුවන් 322 ක් සඳහා මෙම වැඩසටහන් පවත්වා තිබුණි.

ii. මෙම වැඩසටහන මගින් අපේක්ෂිත මාධ්‍ය ප්‍රචාරයන් සිදුකළ බවට සනාථ කළහැකි සාක්ෂි කාර්යාංශය විසින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පෞද්ගලික හා රජයේ ආයතන සියල්ල ඒකාබද්ධ කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය වියදම් දැරීම සිදුකළ යුතු බවට 2011 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා සමාලෝචිත වර්ෂයේ චීනයේ සහ ඉන්දියාවේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන් දෙකකට රු.324,998,601 ක් කාර්යාංශය පමණක් වියදම් දරා තිබුණි. එහෙත් මෙම වැඩසටහන් දෙකට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සියයකට වඩා සහභාගි වී තිබුණත් එම ආයතනවලින් දායක මුදල් ලබාගෙන නොතිබුණි.

### 4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

කාර්යාංශයේ අතිරික්ත මුදල් රු.මිලියන 1,200 ක් පමණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 27 දින දක්වා සුදුසු ආයෝජනයක නොයෙදවීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.මිලියන 134 ක් පමණ ආයතනයට අහිමි වී තිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකරගැනීම සඳහා අදාල වියදමක් ලෙස හඳුනා නොගත් "උපාධිධාරී අභ්‍යාසලාභී සමුළුවට" සංග්‍රහ කිරීම සඳහා රු.5,996,000 ක් වැයකර තිබුණි.

(ආ) රේගුව අමාත්‍යාංශයට අදාල දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ සංචාරක වෙළඳ ප්‍රජාව සඳහා ඇඳුම් ලබාදීමට රු.5,563,488 ක් එක්තරා පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ශුද්ධ අතිරික්තයෙන් රු.200,000,000 ක් පළාත් සහා හතරකට සංචාරක වෙළඳ ප්‍රවර්ධන කටයුතු සංවර්ධනයට ලබා දී තිබුණු නමුත් එම මුදල් අදාල වෙළඳ ප්‍රවර්ධන කටයුතුවලට යෙදවූ බවට සහ එම කටයුතුවල ප්‍රගතිය පිළිබඳව වාර්තා කාර්යාංශය සතුව නොතිබුණි.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව හා විනිවිද භාවයකින් තොරව මිලගණන් කැඳවා එක්තරා රංග ආයතනයකින් නැටුම් කණ්ඩායමක් තෝරාගෙන රු.3,015,000 ක් ගෙවා තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පවතී. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මානව සම්පත් සඳහා මුළු පිරිවැය පිළිවෙළින් රු.මිලියන 31.5 ක් සහ රු.මිලියන 28.6 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ එක් සේවකයකුගේ පිරිවැය පිළිවෙලින් රු.900,654 ක් සහ රු.622,400 ක් විය.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII වගන්තියේ සඳහන් නියමයන් සැලකිල්ලට නොගෙන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

**4.6 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී කුලියට ගත් වාහන සඳහා රු.11,584,750 ක් ගෙවා තිබුණු අතර වාහන ධාවනය කළ කිලෝමීටර් ගණන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එක් ධාවන කිලෝමීටරයකට වැයවූ පිරිවැය ගණනය කළ නොහැකි විය.

(ආ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී කුළියටගත් වාහනවල පිරිවැය රු.4,992,843 කින් හෙවත් සියයට 75.7 කින් වැඩි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2014 ජුනි 16 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ පරිදි සමාලෝචිත වර්ෂයේ සිට අවම වශයෙන් ඉදිරි වර්ෂ තුනකට අදාලව සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා අලෙවිකරණ හා උපායමාර්ග, ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරි සැලැස්මට ආයතනයේ ශක්තිය,දුර්වලතා,වාසි වූ අවස්ථා සහ තර්ජන හඳුනාගෙන ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම මෙම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක්ද හඳුන්වා දී නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කාර්යභාරය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණද අභ්‍යන්තර විගණන සැලැස්මේ පිටපතක් සහ අභ්‍යන්තර විගණන විමසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.5 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස 3කට වරක් විගණන කමිටු රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ පමණක් රැස්වීමක් පවත්වා තිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද එය 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තියේ නියමයන් ප්‍රකාරව මුදල් වර්ෂයට මාස තුනකට පෙරාතුව අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විෂයයන් 35 ක අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 20 සිට සියයට 132 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර කාර්යාංශයේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය
(ආ) ගිණුම්කරණය
(ඇ) වෙළඳ හා අලෙවිකරණ ක්‍රියාකාරකම්
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) අභ්‍යන්තර විගණනය
(උ) මුදල් කළමනාකරණය